# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය தொலைபேசி: (94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்: (94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்: dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணைத்தளம்: www.pubad.gov.lk Web Site


මගේ අංකය எனது இல My No: රා.ක.ස.සේ/අධි/ස්.මා./2017
ඔබේ අංකය உமது இல Your No: -
දිනය திகதி Date: 2017.01.05

අමාත්‍යාංශ ලේකම්වරුන්,

දිස්ත්‍රික් ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>2017 වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තිය</u>**

ඉහත කරුණ සම්බන්ධව මගේ සමාංක හා 2016.11.18 දිනැති ලිපිය මගින් එවා ඇති වාර්ෂික ස්ථාන මාරු කමිටු යෝජනා හා එම ලිපියේ සඳහන් කරුණු වලට ඔබගේ කාරුණික අවධානය යොමු කරනු ලැබේ.

02. එම ස්ථාන මාරු යෝජනා සම්බන්ධව මා වෙත ඉදිරිපත් වූ කරුණු දැක්වීම් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 210 සහ 211 වගන්ති අනුව වූ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ මේ සමඟ එවමි. මෙමගින් සිදු කරනු ලැබූ සංශෝධනයන්ට යටත්ව ඉහත සඳහන් නිලධාරීන් සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2016.11.18 ලිපිය මගින් යෝජිත 2017 වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් නිකුත් කරමි.

03. **ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් වන අභියාචනා**

(අ) ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධරයන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති **XX වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව** රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කල හැක.

(ආ) වාර්ෂික ස්ථාන මාරු කමිටුවට හා සමාලෝචන කමිටුවට අයදුම්පත් ඉදිරිපත් කල නිලධරයන්ට **පමණක්** රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කල හැක.

(ඇ) අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා **කාර්ය පටිපාටික රීතීන්හි 23 වන පරිශිෂ්ඨය අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මා වෙත** එවිය යුතුය. ඒ සමඟම අභියාචනයෙහි සඳහන් කරුණු සනාථ කිරීමට අදාළ ලේඛණද අමුණා එවන්නේ නම් මැනවි.

(ඈ) ඉදිරිපත් කරන අභියාචනයන් 2017.01.16 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන ලෙස ඉදිරිපත් කල යුතු අතර එදිනට පසුව ඉදිරිපත් කරන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

04. **වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම.**

2017 වර්ෂය සඳහා වූ ස්ථාන මාරු නියෝග රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි වෙනස්කම් වලට යටත්ව නියමිත දිනයේදීම ක්‍රියාත්මක වේ. ඒ අනුව ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධරයන් නියමිත දිනයේ නව සේවා ස්ථානයන්හි රාජකාරි බාර ගැනීමට හැකිවන පරිදි අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන මුදා හැරීමට ක්‍රියාකරන ලෙස දන්වා සිටිමි. 2017 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව අදාළ නිලධරයන් සේවයට වාර්තා කල බවට හා මුදාහල බවට වන ලිපි වල පිටපත් ඒ.සේ/වා.ස්.මා/05, හා ඒ.සේ/වා.ස්.මා/06 ආකෘති අනුව මා වෙත ඉදිරිපත් කල යුතුය.

05. වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ මා විසින් දී ඇති ස්ථාන මාරු නියෝගවලට අමතරව අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග යටතේ කිසියම් නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් ලැබී තිබුනේ වුවද, මෙම සමාලෝචන කමිටු තීරණවලින් වූ සංශෝධන වලට යටත්ව 2016.11.18 දිනැති වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු බව සැලකීම මැනවි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
Ministry of Public Administration and Management
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07.
Independence square - Colombo 7.
Web Site : www.pubad.gov.lk

## වාර්ෂික ස්ථාන මාරුවීම් සමාලෝචන කමිටු තීරණ - 2017

(வருடாந்த இடமாற்ற மீளாய்வுக் குழு முடிவு – 2017)

### රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය - අධි පන්තිය

| අනු අංකය | සේවක අංකය | නම<br>பெயர் | වර්තමාන සේවා ස්ථානය<br>நிகழ்கால சேவை நிலையம் | නව සේවා ස්ථානය<br>புதிய சேவை நிலையம் | අභියාචනා තීරණ<br>மேன்முறையீட்டு முடிவுகள் |
|---|---|---|---|---|---|
| 1. | 011959 | එන්.ඩබ්.යූ.ජයලත් මහතා | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | වෙනසක් නොමැත |
| 2. | 035949 | යූ.එච්.එන්.පී.උණගල්ල මයා | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | | ඉල්ලීම ඉටු කළ නොහැක |
| 3. | 022541 | එස්.ශිවගරන් මිය<br>திருமதி எஸ். சிவகரன் | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය,වව්නියා<br>தேசிய கல்வியற் கல்லூரி, வவுனியா | | ඉල්ලීම ඉටු කළ නොහැක<br>கோரிக்கையை நிறைவேற்ற முடியாதுள்ளது |